සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2024 ජූලි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

2024-08-10
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ මූලික අවස්ථාවේ අපරාධ නඩු සම්බන්ධයෙන් අධිකරණ බලය පවතින්නේ කුමන අධිකරණයට ද?

(1) ශ්‍රේෂ්ඨාධිකරණය. (2) අභියාචනාධිකරණය.
(3) මහේස්ත්‍රාත් අධිකරණය. (4) දිස්ත්‍රික් අධිකරණය.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක සඳහන් මූලික මූලිකාංගයන් වන්නේ කුමක් ද?

(1) ගිවිසුමේ විෂය වස්තුව, භාණ්ඩ විය යුතුය.

(2) විකුණුම්කරු විසින් භාණ්ඩවල අයිතිය ගැණුම්කරුට පැවරිය යුතුය.

(3) ගිවිසුම තුළ මූල්‍යමය ප්‍රතිඡ්ඨාවන් අන්තර්ගත විය යුතුය.

(4) ඉහත සඳහන් සියල්ලම.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, ජාත්‍යන්තර වෙළඳාම තුළ අධිකරණමය නොවන ආරවුල් විසඳීමක් **නොවන්නේ** කුමක් ද?

(1) බේරුම්කරණය. (2) සමථකරණය.

(3) වාණිජ මණ්ඩලය. (4) ජාත්‍යන්තර නීති.

**1.4** විනිමය බිල්පතක් පිටසන් කිරීමට අදාලව පහත සඳහන් උදාහරණය ඔබට දී ඇත:

> **ලදුපත අත්සන් කළහොත් පමණක් ගෙවන්න.**
> **එන්.එස්. පෙරේරා**

විනිමය බිල්පතේ ඉහත සඳහන් පිටසන් කිරීම,

(1) හිස් පිටසනකි. (2) විශේෂ පිටසනකි.

(3) කොන්දේසි සහිත පිටසනකි. (4) සීමාකාරී පිටසනකි.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, ගිවිසුමක් අවසන් කරන ක්‍රමයක් වන්නේ කුමක් ද?

(1) ඉටු කිරීමෙන්. (2) කඩ කිරීමෙන්.

(3) ව්‍යවර්ථ වීමෙන් (By frustration). (4) ඉහත සඳහන් සියල්ලම.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, නෞභාර පත්‍රයක් සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) එය නැව්ගත කළ භාණ්ඩ සඳහා කුවිතාන්සියක් (receipt) ලෙස ක්‍රියා කිරීම.

(2) එහි භාණ්ඩවල ප්‍රමාණය, විශාලත්වය සහ බර සඳහන් වේ.

(3) එය ජාත්‍යන්තර වෙළඳාමේදී ගෙවීමේ මාධ්‍යයක් ලෙස භාවිත වේ.

(4) එය භාණ්ඩවල හිමිකම තහවුරු කිරීමට භාවිත කරයි. (එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

*අංක 1.7 සිට 1.9 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.7** අභියාචනාධිකරණයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීමේ අධිකරණ බලය ඇත.

**1.8** භාණ්ඩ විකිණීමේ ආඥා පනතට අනුව, විකුණුම්කරු හට භාණ්ඩවලට එරෙහිව ප්‍රතිකර්ම (remedies) පවතී.

**1.9** චෙක්පතක් යනු විනිමය බිල්පතක් නොවේ. (එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක 1.10 සිට 1.14 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.10** ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල දෙකක්(02) සඳහන් කරන්න.

**1.11** "සාමාන්‍ය රේඛණය" සහ "විශේෂ රේඛණය" අතර වෙනස සඳහන් කරන්න.

**1.12** පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යභාරයන් දෙකක්(02) සඳහන් කරන්න.

**1.13** CIF (මිල, රක්ෂණය, ගැල් කුලිය) ගිවිසුමකදී විකුණුම්කරුගේ වගකීම් දෙකක්(02) සඳහන් කරන්න.

**1.14** ගනුදෙනු කළ නොහැකි ලියවිලි සඳහා උදාහරණ දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

**බණ්ඩාර,** වෘත්තියෙන් නීතිවේදියෙකු වන අතර, ඔහු විසින් විදේශීය වීසා උපදේශන සේවා ආයතනයක් පවත්වාගෙන යනු ලබයි. **බණ්ඩාරගේ** ආයතනයේ ව්‍යාපාර කටයුතු කළමනාකරණය කිරීමේ බලය **විදේශිකා** හට පවරා ඇත. ඔවුන්ගේ ගිවිසුම් ලේඛණයේ සඳහන් පරිදි, ප්‍රංශ රාජ්‍යයට අදාළ කිසිදු වීසා (visa) සම්බන්ධ කටයුත්තකට උපදෙස් ලබාදීම හෝ සිදුකිරීම නොකරන ලෙස **විදේශිකාට** උපදෙස් දී ඇත. නමුත් **විදේශිකා** විසින් **ෆැන්ක්** හට ඉහළ ගාස්තුවක් යටතේ ප්‍රංශයට අදාළ වීසා ගැටළුවක් මෙහෙයවා අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී. අවාසනාවකට, **විදේශිකාගෙන්** සිදුවූ වරදක් හේතුවෙන් එම කටයුත්ත අසාර්ථක වූ අතර, **ෆැන්ක්** විසින් **බණ්ඩාරගෙන්** වන්දියක් ඉල්ලා සිටින ලදී. කෙසේවුවද, **බණ්ඩාර** විසින් වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **බණ්ඩාර** සහ **විදේශිකා** අතර ඇති නියෝජ්‍යත්ව සම්බන්ධතාවයේ ස්වභාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) **ෆැන්ක්** හට බණ්ඩාරගෙන් වන්දි ඉල්ලා සිටිය හැකිද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

(a) **A, B** සහ **C** යනු **ABC හවුල් ව්‍යාපාරයේ,** හවුල්කරුවන්ය. **සීමාසහිත කුරේ සමාගම, ABC හවුල් ව්‍යාපාරයේ** තරඟකරුවෙකු වේ. **B** විසින් **සීමාසහිත කුරේ සමාගමේ** ගනුදෙනුකරුවන්ගෙන් රහස්‍ය තොරතුරු ලබාගැනීම සඳහා එහි අලෙවි කළමනාකරු හට අල්ලසක් ලබා දී ඇති අතර, එම තොරතුරු **ABC හවුල් ව්‍යාපාරය** වෙත ලබා දී ඇත. **ABC හවුල් ව්‍යාපාරයේ** එක් හවුල්කරුවෙකු තම සමාගමේ අලෙවි කළමනාකරුට අල්ලස් ලබා දුන් බව **සීමාසහිත කුරේ සමාගමේ** සභාපතිවරයා දැනගත් අතර, මේ සම්බන්ධයෙන් සමාගම විසින් **ABC හවුල් ව්‍යාපාරයේ** සියලුම හවුල්කරුවන්ට එරෙහිව නඩු පවරා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මේ සම්බන්ධයෙන් **ABC හවුල් ව්‍යාපාරයේ,** හවුල්කරුවන්ගේ වගකීම **විමසන්න.** (ලකුණු 06)

(b) සමාගම් සඳහා ශ්‍රී ලංකාවේ අදාළ නීතිය වන්නේ 2007 අංක 07 දරණ සමාගම් පනත වේ. සමාගමක් සතුව විවිධ ලක්ෂණ පවතින අතර, නීතිමය පුද්ගලභාවය එයින් එක් ලක්ෂණයක් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සමාගමක් සම්බන්ධයෙන් නීතිමය පුද්ගලභාවය යන සංකල්පය **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

**මාලිනී** යනු ප්‍රසිද්ධ නාට්‍ය නිෂ්පාදකයෙකු වන **මහාචාර්ය ගාමිණීගේ** බිරිඳ වේ. 1985 දී, ඔහු විසින් ප්‍රසිද්ධ වේදිකා නාට්‍යයක් වන "බැරි-නැනා" නිෂ්පාදනය කර මහජනතාවට ප්‍රදර්ශනය කරන ලදී. 2010 දී, **මහාචාර්ය ගාමිණී** මියගිය අතර, පසුව **මාලිනී** විසින් ඇයගේ ස්වාමි පුරුෂයාගේ නාට්‍ය කටයුතු ඉදිරියට කරගෙන යන ලදී. 2015 දී, අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් "බැරි-නැනා" නාට්‍යය අ.පො.ස. (උ/පෙ) සිංහල විෂය ධාරාවේ කොටසක් ලෙස තෝරාගන්නා ලදී. ප්‍රසිද්ධ සිංහල උපකාරක පංති ගුරුවරයෙකු වන **අනිල්** මෙම "බැරි-නැනා" නාට්‍ය පිටපත පොතක් ලෙස මුද්‍රණයකොට ඔහුගේ උපකාරක පන්තියේ ශිෂ්‍යයන්ට සැළකිය යුතු මුදලකට අලෙවි කරන ලදී.

**මාලනී විසින් අනිල්ට** එරෙහිව මෙම පොත පළකිරීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්නා ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත යටතේ ආරක්ෂාව සැලසෙන බුද්ධිමය දේපළ හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) **අතිල්ට** එරෙහිව ගනු ලබන නීතිමය පියවර සම්බන්ධයෙන් **මාලනීට** සාර්ථක විය හැකිද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**පෙරේරා** විසින් තම නිවස ගින්නෙන් ආවරණය කිරීම සඳහා **සීමාසහිත ZZ ඉන්ෂුවරන්ස් සමාගමෙන්** රු.5,000,000/- ක් සහ **සීමාසහිත AZ ඉන්ෂුවරන්ස් සමාගමෙන්** රු.3,500,000/- ක් වශයෙන් රක්ෂණ ඔප්පු දෙකක් ලබාගෙන ඇත. පසුව, විදුලි කාන්දුවීමක් නිසා හටගත් ගින්නකින් මෙම නිවසට අලාභයක් සිදුවී ඇති අතර, සිදුව ඇති අලාභය රු.1,400,000/- කි. **පෙරේරා** විසින් එක් සමාගමකින් රු.1,400,000/- බැගින් රක්ෂණ සමාගම් දෙකෙන්ම අලාභය අයකර ගැනීමට හිමිකම් පවතින බවට විශ්වාස කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) එක් සමාගමකින් රු.1,400,000/- බැගින් රක්ෂණ සමාගම් දෙකෙන්ම වන්දි සඳහා **පෙරේරාට** හිමිකම් තිබේද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ පාර්ශව දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**මහානාම** අලුත් කුනිස්සන් මිලදී ගැනීම සඳහා **දිලීප්ට** අයත් **'දිලීප් මාළු වෙළෙඳසැල'** ට යන ලදී. **දිලීප්** විසින් අලුත් කුනිස්සන් බව පවසමින් **මහානාම** වෙත කුනිස්සන් මල්ලක් ලබාදෙන ලදී. **මහානාම** ඒවා නිවසට ගෙනවිත් තම පවුලේ අය සමඟ පරිභෝජනය කරන ලදී. පසුදින, ඔහු ඇතුළුව පවුලේ සියලු දෙනාම රෝගාතුර වී ඇති බව ඔහුට අවබෝධ විය. මෙම අසනීපයට හේතුව ආහාර අසාත්මිකතාවයක් බව වෛද්‍යවරයා ප්‍රකාශ කරන ලදී. **දිලීප්** විසින් විකුණා ඇත්තේ අලුත් කුනිස්සන් නොව ඉතා පරණ කුනිස්සන් බව **මහානාම** සොයාගන්නා ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මහානාම සතු නෛතික අයිතිවාසිකම් (legal rights) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතට එන භාණ්ඩ වර්ග දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

(A) **සචාරිකා** යනු ලෝකයේ රටවල් 25 කට අධික සංඛ්‍යාවකට සංචාරය කර ඇති පළපුරුදු සංචාරකයෙකි. එනිසා, එහි ස්වභාවය අනුව ඇගේ විදේශ ගමන් බලපත්‍රය විශේෂිත එකක් වේ. අවාසනාවන්ත ලෙස, **සචාරිකාගේ** නිවස පසුගිය සිකුරාදා දින රාත්‍රියේ කොල්ලකන ලදී. **සචාරිකාගේ** විදේශ ගමන් බලපත්‍රය ඇතුළු භාණ්ඩ රැසක් සොරුන් විසින් කොල්ලකන ලදී. මේ සම්බන්ධව පොලිස් පැමිණිල්ලක් දමන ලද අතර, **සචාරිකා** විසින් ඇගේ විදෙස් ගමන් බලපත්‍රය සොයාගෙන නැවත බාරදෙන අයෙකුට රු.100,000/- ක ත්‍යාගයක් පිරිනමන බව සඳහන් දැන්වීමක් ඇයගේ නිවසේ ගේට්ටුවේ ඇලීමට තීරණය කරන ලදී. ඇය එක්සත් රාජධානියට සංක්‍රමණය වීම සඳහා සැලසුම්කොට ඇති අතර, වීසා ලබා ගැනීමේ ක්‍රියාවලියේදී ඇගේ විදේශ ගමන් බලපත්‍රයට විශාල වටිනාකමක් ලැබෙන බැවින් ඇය එසේ කරන ලදී.

**පිරිසිඳු** යනු **C-Gills සුපර්** නම් දේශීය සුපිරි වෙළෙඳසැලේ සිටින තරුණ පිරිසිඳු කරන්නෙකු වේ. ඔහු විසින් වෙළෙඳසැලේ බඳුන් සුද්ද කිරීමේදී, බඳුන තුළ තිබී විදේශ ගමන් බලපත්‍රයක් සොයාගන්නා ලදී. විදේශ ගමන් බලපත්‍රයේ විස්තර පිටුවේ නම ලෙස **"ක්‍රිස්ටෝපර්ගේ සවාරිකා කොලම්බස් මිය"** යනුවෙන් සටහන්ව ඇති බව **පිරිසිඳුට** දැක ගත හැකි විය. **සවාරිකා** යනු **C-Gills සුපර්** හි නිත්‍ය පාරිභෝගිකයෙකු බව **පිරිසිඳු** දනී. එදිනම දහවල, **සවාරිකා** සුපිරි වෙළෙඳසැලට පැමිණි විට **පිරිසිඳු** විදේශ ගමන් බලපත්‍රය **සවාරිකා** වෙත බාරදෙන ලදී. සවස් කාලයේදී ඔහු **සවාරිකාගේ** නිවස පසු කරමින් ආපසු තම නිවස වෙත යන විටදී **පිරිසිඳුට** ගේට්ටුවේ සඳහන් දැන්වීම දැක ගත හැකි විය. ඔහු විසින් රු.100,000/- ක ත්‍යාග මුදල ඉල්ලා සිටි විට, **සවාරිකා** විසින් එය ප්‍රතික්ෂේප කරන ලදී. **පිරිසිඳු** විසින් **සවාරිකාට** එරෙහිව නඩු පැවරීමට සූදානම් වෙමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **පිරිසිඳු** ට, **සවාරිකා** ට එරෙහිව නෛතික පියවර ගත හැකිද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) වලංගු ගිවිසුමක් සඳහා වන අවශ්‍යතා හතරක්(04) **පැහැදිලි කරන්න.** (ලකුණු 08)

(B) (a) 2022 පෙබරවාරි 01 දින, **සිල්වා** ජාතික ගුවන් සේවය වන **සීමාසහිත ලංකා එයාර් සමාගමේ** පළිබෝධ (pest) පාලන ඒකකයේ සාමාජිකයෙකු ලෙස සම්බන්ධ විය. **සීමාසහිත ලංකා එයාර් සමාගමේ** පළිබෝධ පාලන ඒකකයේ සාමාජිකයෙකු වශයෙන්, පළිබෝධ නිරීක්ෂණය, තක්සේරු කිරීම්, පරීක්ෂණ කිරීම සහ ගුවන් යානා තුළ "මීයන්" වැනි පළිබෝධ පාලන කටයුතු සඳහා ඔහු සුදුසු බවට සොයාගන්නා ලදී. පාර්ශවයන් අතර ඇති කරගත් ගිවිසුමට අනුව, **සිල්වා** විසින් **සීමාසහිත ලංකා එයාර් සමාගමේ** සුභසිද්ධිය උදෙසා කටයුතු කිරීමට බැඳී සිටී. ඔහු එසේ කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ සේවය අවසන් කිරීමට සමාගමට හැකියාව ඇත. සෑම දිනකම උදෑසන 9.30 ට ප්‍රථම, **සිල්වා** කාර්යාලයට වාර්තා කළ යුතුය. **සීමාසහිත ලංකා එයාර් සමාගම** අවශ්‍ය කරන පළිබෝධ පාලන උපකරණ සපයනු ලද අතර, ඉහත සඳහන් රැකියා විස්තරයට අදාල වියදම් සමාගම දරණ ලදී.

වසර දෙකකට පසුව, 2024 පෙබරවාරි 29 දින, **සීමාසහිත ලංකා එයාර් සමාගම සිල්වාගේ** සේවය අවසන් කරන ලදී. මෙම අවස්ථාවේදී, **සිල්වා** තමා සමාගමේ සේවකයෙකු බවට තර්ක කරනු ලැබිණි. කෙසේවුවද, **සීමාසහිත ලංකා එයාර් සමාගම** ප්‍රකාශ කරනු ලැබුවේ ඔහු ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු බවයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් පරීක්ෂණ මත පදනම්ව, **සිල්වා** යනු සේවකයෙකුද, ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකුද යන්න **පැහැදිලි කරන්න**:

- ඒකාබද්ධ පරීක්ෂණය (The Integration Test).
- පාලනය පිළිබඳ පරීක්ෂණය (The Control Test).
- උපකරණ පිළිබඳ පරීක්ෂණය (The Equipment Test). (ලකුණු 06)

(b) **නසීර්,** 2016 අප්‍රේල් 01 දින, රු.80,000/- ක වැටුපකට සීමාසහිත පෞද්ගලික සමාගමකට බැඳුනු අතර, ඔහුට එම ආයතනයේ සේවකයෙකු ලෙස සේවක භාරකාර අරමුදලට [Employees Trust Fund (ETF)] සහ සේවක අර්ථසාධක අරමුදලට [Employees Provident Fund (EPF)] හිමිකම් කියනු ලැබේ. ඔහු රජයේ අමාත්‍යාංශයක ස්ථිර රැකියාවකට යාම සඳහා 2024 ජුනි 30 දින සිට බලපැවැත්වෙන පරිදි සේවයෙන් ඉවත්වීමේ ලිපියක් බාර දී ඇත. ඔහුගේ අවසන් මාසයේ වැටුප රු.300,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) සේවය අවසන් කිරීමේදී, **නසීර්** ට හිමි පාරිතෝෂිකය **ගණනය කරන්න.** (ලකුණු 03)

(ii) සේවක අර්ථසාධක අරමුදල (EPF) ආපසු ලබාගැනීමට ඔහුට ඇති අයිතිය පිළිබඳව **නසීර්** ට **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |